සියළුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

Neertha Law Academy Neertha Law Academy Neertha Law Academy Neertha Law Academy Neertha Law Academy Neertha Law Academy Neertha Law Academy

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - නීතිවේදී උපාධි ප්‍රවේශ විභාගය
# Sri Lanka Open University - LLB - Law Entrance Course

**වර්ෂය - 2011**
**Year - 2011**

**පැය 2 යි**
**Two hours**

Index No: ………………………………………………

Checked as Correct

………………………………………………
Invigilator's Initials

Name:……………………………………………………………………………………………………………………………

**විභාග අපේක්ෂකයාට උපදෙස් :**

- මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ.
  (අ) I වන ප්‍රශ්න පත්‍රය - සාමාන්‍ය බුද්ධිය
  (අ) II වන ප්‍රශ්න පත්‍රය - සාමාන්‍ය දැනීම
  (අ) III වන ප්‍රශ්න පත්‍රය - භාෂා පරීක්ෂණය

**ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතු ආකාරය:**

- **I වන ප්‍රශ්න පත්‍රයට - සාමාන්‍ය බුද්ධිය** ප්‍රශ්න 40 කින් සමන්විත වේ.සියළුම ප්‍රශ්නවලට පිළිතුරු ලකුණු කළ යුත්තේ පිළිතුරු පත්‍රයේ පමණි. දී ඇති පිළිතුරු වලින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ එම පිළිතුරට අදාළ අකුර මත කතිර ලකුණක් යොදන්න.(උදාහරණයක් ලෙස (a) පිළිතුර නිවැරදි වේ නම්)
  උදා: ~~(a)~~ (b) (c) (d)
  ගණක යන්ත්‍ර හෝ වෙනත් එබඳු උපකරණ භාවිත කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

- **II වන ප්‍රශ්න පත්‍රය - සාමාන්‍ය දැනීම** ප්‍රශ්න 40 කින් සමන් විත වේ.සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- **III වන ප්‍රශ්න පත්‍රය - භාෂා පරීක්ෂණය** කොටස් 02කින් සමන්විත වේ.**A** කොටස ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය වන අතර **B** කොටස සිංහල භාෂා පරීක්ෂණය වේ.**A** සහ **B** යන කොටස් දෙකටම දී ඇති ස්ථාන වල පිළිතුරු සපයන්න.
- විභාග ශාලාධිපති විසින් දැනුම් දෙන තුරු ප්‍රශ්න පත්‍රය විවෘත නොකරන්න.
- විභාග අංකය නියමිත ස්ථානයේ සඳහන් කරන්න.

| Page No: | Question No: | Marks |
|---|---|---|
| සාමාන්‍ය බුද්ධිය | | |
| 2 | 01 - 06 | |
| 3 | 07 - 16 | |
| 4 | 17 - 15 | |
| 5 | 26 - 31 | |
| 6 | 32 - 40 | |
| සාමාන්‍ය දැනීම | | |
| 7 | 01 - 10 | |
| 8 | 11 - 21 | |
| 9 | 22 - 32 | |
| 10 | 33 - 40 | |
| භාෂා පරීක්ෂණය | | |
| | Total | |

ශ්‍රී ලංකා නීති ප්‍රවේශ ජය මගේ විශ්වාසයා Neertha

**I වන ප්‍රශ්න පත්‍රයට - සාමාන්‍ය බුද්ධිය**

- **ප්‍රශ්න 40 ටම පිළිතුරු සපයන්න.**
- **ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ ඔබේ පිළිතුරු සළකුණු කරන්න. මෙම ප්‍රශ්න පත්‍රයෙහි ම පිළිතුරු ලියා ඇත්නම් ඒ සඳහා ලකුණු නොලැබේ.**

<u>ප්‍රශ්න අංක **1 – 4** දක්වා</u>

A+B යන්නෙන් A වූ කලී B ගේ පුත්‍රයෙක් බව අදහස් වේ. A-B යන්නෙන් A වූ කලී B ගේ භාර්යාව බව අදහස් වේ. A×B යන්නෙන් A වූ කලී B ගේ සහෝදරයා බව අදහස් වේ. A/B යන්නෙන් A වූ කලී B ගේ මව බව අදහස් වේ. A=B යන්නෙන් A වූ කලී B ගේ සහෝදරිය බව අදහස් වේ.

1. X+Y-Z යන්නෙන් කුමක් අදහස් වේද?
   a) Z වූ කලී X ගේ පියා බවයි.
   b) Z වූ කලී X ගේ පුත්‍රයා බවයි.
   c) Z වූ කලී Y ගේ මාමා බවයි
   d) Z වූ කලී Y ගේ ඥාති පුත්‍රයා බවයි.
   e) ඉහත කිසිවක් නොවේ.

2. X×Y/Z යන්නෙන් කුමක් අදහස් වේද?
   a) X වූ කලී Y ගේ සහෝදරයා බවයි.
   b) X වූ කලී Z ගේ පියා බවයි.
   c) X වූ කලී Z ගේ මාමා බවයි .
   d) X වූ කලී Z ගේ ඥාති පුත්‍රයා බවයි.
   e) ඉහත කිසිවක් නොවේ.

3. X=Y/Z යන්නෙන් කුමක් අදහස් වේද?
   a) X වූ කලී Y ගේ නැන්දා බවයි.
   b) X වූ කලී Z ගේ සහෝදරිය බවයි.
   c) Z වූ කලී X ගේ ඥාති දියණිය බවයි.
   c) Z වූ කලී X ගේ දියණිය බවයි.
   e) ඉහත කිසිවක් නොවේ.

4. X=Y+Z යන්නෙන් කුමක් අදහස් වේද?
   b) X වූ කලී Z ගේ නැන්දා බවයි.
   b) X වූ කලී Z ගේ සහෝදරිය බවයි.
   c) Z වූ කලී X ගේ ඥාති දියණිය බවයි.
   c) Z වූ කලී X ගේ දියණිය බවයි.
   e) ඉහත කිසිවක් නොවේ.

<u>ප්‍රශ්න අංක **5 – 9** දක්වා</u>

මෙම ප්‍රශ්නවල කණ්ඩායමට පොදු ලක්ෂණය නොමැති වීම නිසා කණ්ඩායමට අයත් නොවන අංක දෙක කුමක්දැයි සලකුණු කරන්න.

5. a) 50 , 55 b) 30 , 34 c) 75 , 80 d) 13 , 18 e) 15 , 20

6. a) 22 , 29 b) 74 , 67 c) 111 , 104 d) 11 , 20 e) 196 , 203

7. a) 16 , 8 b) 36 , 27 c) 64 , 18 d) 100 , 125 e) 32 , 21

8. a) 8 , 33 b) 9 , 28 c) 15 , 46 d) 12 , 37 e) 13 , 40

9. a) 9 , 73 b) 13 , 157 c) 4 , 21 d) 6 , 31 e) 7 , 43

10. $6 \times 17 = 716$ නම්, $13 \times 56 = 6531$ නම්, $19 \times 10 = 191$ නම්, එවිට $32 \times 27 = ?$
a) 4344 b) 1309 c) 1714 d) 7223 e) 7327

11. $9 \times 3+8 = 24$ නම්, $10 \times 2/7 = 35$ නම්, $80 \times 40 + 3 = 6$ නම්, එවිට $12 \times 4 +3 = ?$
a) 7 b) 9 c) 16 d) 12 e) 24

12. පියෙක් වර්ථමානයේ තම පුත්‍රයාට වඩා තුන් ගුණයකින් වැඩිමහල් වේ. අවුරුදු පහකට ඉහත දී පියා පුත්‍රයාට වඩා හතර ගුණයකින් වැඩිමහල් විය.පුත්‍රයාගේ වයස කීයද?
a) 12 b) 11 c) 20 d) 18 e) 15

13. (දින 31 ක් ඇති.) ඉරිදා දිනයෙන් ආරම්භ වන මාසයක පළමුවන හා හතරවන සෙනසුරාදා දින හා සියළු ඉරිදා දින නිවාඩු දින වේ නම් එම මාසයේ වැඩ කරන දින ගණන කීයද?
a) 24 b) 23 c) 20 d) 25 e) 22

<u>ප්‍රශ්න අංක **14 – 17** දක්වා</u>

නොගැළපෙන වදන සොයන්න.

14. a) ගාල්ල b) කොළඹ c) හම්බන්තොට d) ත්‍රිකුණාමලය e) මන්නාරම

15. a) පියා b) මව c) සහෝදරිය d) පුත්‍රයා e) දියණිය

16. a) සිංහයා b) කොටියා c) උකුස්සා d) මීහරකා e) කපුටා

17. a) ඇමරිකාව b) කැනඩාව c) ඉන්දියාව d) බ්‍රසීලය e) ශ්‍රී ලංකාව

18. A දුම්රිය ස්ථානයෙන් ගමන් අරබන දුම්රියක් පැයට කි.මී. 48 ක වේගයෙන් B දුම්රිය ස්ථානය කරා ගමන් කරයි. විනාඩි 45 කට පසු තවත් දුම්රියක් B දුම්රිය ස්ථානයෙන් පිටත් වී A දුම්රිය ස්ථානය කරා පැයට කි.මී. 50 වේගයෙන් ගමන් කරයි. A හා B දුම්රිය ස්ථාන දෙක අතර දුර ප්‍රමාණය කි.මී.232 ක් වේ නම් A දුම්රිය ස්ථානයෙන් කවර දුරක දී දුම්රිය දෙක මුණ ගැසේද?
a) කි.මී. 144 b) කි.මී. 160 c) කි.මී. 125 d) කි.මී. 108 e) කි.මී. 132

19. P, Q සහ R යනු ටැංකියකට සවි කර ඇති බට තුනකින් ටැංකිය පිරවීමට P බටයට විනාඩි 10 ක් ද, Q බටයට විනාඩි 15 ක් ද ගත වන අතර ටැංකිය හිස් කිරීමට R බටයට විනාඩි 20 ක් ගත වේ. P, Q සහ R බට වරකට විනාඩිය බැගින් පිළිවෙලින් විවෘත කර තැබුවේ නම් ටැංකිය පිරවීමට ගත වන කාලය ආසන්න සම්පූර්ණ විනාඩියට සඳහන් කරන්න.
a) 24 b) 25 c) 26 d) 20 e) 22

20. ලාච්චුවක මේස් 53ක් ඇත. ඒවායින් 21ක් නිල් පාටය. 15ක් කළු පාටය. 17ක් රතු පාටය. කාමරය සම්පූර්ණ අඳුරේ පැවතියේ නම් සියයට සියයක් නිවැරදිව කළු මේස් ජෝඩුවක් තෝරා ගැනීම සඳහා මේස් කීයක් එලියට ගත යුතු වන්නේද?
a) 25 b) 32 c) 50 d) 40 e) 38

21. මගේ අත් ඔරලෝසුව දහවල් 12 ට නිවැරදි වේලාව දැක්වූ නමුත් ඉන්පසු පැයකට විනාඩි 17 ක් අඩුවෙන් ගමන්කොට පැය හයකට කලින් සම්පූර්ණයෙන්ම නතර විය.එහි දැක්වෙන වේලාව වනුයේ ප.ව. 2.52 වශයෙන් නම් දැන් වේලාව කීයද?
a) ප.ව. 7 b) ප.ව. 8 c) ප.ව. 9 d) ප.ව. 10 e) ප.ව. 11

22. කමල් , තිස්ස හා රූපා තමන් අතර කිසියම් මුදලක් බෙදා ගනිති. කමල්ට සම්පූර්ණ මුදලින් 2/5 ක් ද තිස්සට 0.55 ක් ද රූපා ට රු.45.00 ක් ද ලැබේ නම් සම්පූර්ණ මුදල කීයද?
a) 700 b) 750 c) 900 d) 600 e) 300

23. කාසි තුනක් උඩ දැමූ විට ඉන් දෙකක් මුහුණ උඩට සිටින සේ වැටේ.නැවත වතාවක් කාසි තුන උඩ දැමූ විට යළිත් අඩු වශයෙන් කාසි දෙකක් මුහුණ උඩට සිටින සේ වැටීමට තිබෙන සම්භාවිතාවය කුමක් ද?
a) 50% b) 33 % c) 25 % d) 40 % e) 70%

24. ඡයාරූපයක් දෙස බලමින් මිනිසෙක් මෙසේ කියයි.'මෙහි සිටින මිනිසාගේ පියා මගේ පියාගේ පුත්‍රයාගේ පුත්‍රයා වන අතර මට සහෝදර සහෝදරියන් කිසිවකු නොමැත'. ඔහු නරඹමින් සිටින්නේ කවරෙකුගේ ඡයාරූපයක් ද?
a) ඔහුගේ ඥාති පුත්‍රයාගේ ඡයාරූපයක්. b) ඔහුගේ මාමාගේ ඡයාරූපයක්.
c) ඔහුගේ පියාගේ ඡයාරූපයක්. c) ඔහුගේ පුත්‍රයාගේ ඡයාරූපයක්.
e) තමන්ගේම ඡයාරූපයක්.

25. මාසයක 10 වන දිනය ඉරිදා දිනයට දින 3ක් පෙර යෙදේ නම්.මාසයේ 2 වන දිනය යෙදෙන්නේ කවර දිනයක ද?
a) අඟහරුවාදා b) සිකුරාදා c) බදාදා d) බ්‍රහස්පතින්දා e) සඳුදා

26. මගේ සහෝදරයා මට වඩා දින 562ක් වැඩිමහල් වන අතර මගේ සහෝදරිය ඔහුට වඩා සති 75ක් වැඩිමහල් වේ.මගේ සහෝදරිය අඟහරුවාදා දිනක උපත ලැබුවේ නම් මම උපන්නේ කවර දිනකද?
a) ඉරිදා b) සඳුදා c) අඟහරුවාදා d) බදාදා e) සෙනසුරාදා

27. සිසුන් 49 ක් සිටින පන්තියක පීටර් ඉහළ සිට 16 වන ස්ථානයේ සිටී.පහළ සිට ඉහළට ඔහු සිටින ස්ථානය කීයද?
a) 33 වැනියා b) 24 වැනියා c) 36 වැනියා d) 35 වැනියා e) මේ කිසිවක් නොවේ

28. රාත්‍රී භෝජන සංග්‍රහයක් අවසානයේදී පුද්ගලයන් 10 දෙනෙක් එකිනෙකාට අතට අත දෙති.අතට අත දීම් කීයක් සිදුවුයේද?
a) 100 b) 20 c) 45 d) 50 e) 90

29. ඊයේ ට පෙර දින සෙනසුරාදාට දින තුනක් පසු වී යෙදී ඇත අද කවදාද?
a) සඳුදා b) අඟහරුවාදා c) බදාදා d) බ්‍රහස්පතින්දා e) සිකුරාදා

30. පහත කොටුවේ ප්‍රශ්නාර්ථය දැක්වෙන ස්ථානයට යෙදෙන අංකය කුමක්ද?

| | | | |
|---|---|---|---|
| 17 | 8 | 5 | 5 |
| 13 | 7 | 5 | 4 |

6 12 6 3

| | | | |
|---|---|---|---|
| 10 | 6 | 4 | ? |

a) 4 b) 5 c) 6 d) 7 e) 8

<u>**ප්‍රශ්න අංක 31 – 40 දක්වා**</u>

හිස්තැන් පුරවන්න

31. 4 , 25 , 64 , 121 ,196 , **?**
a) 298 b) 384 c) 256 d) 225 e) 289

32. 1 , 4 , 10 , 22 , 46 , **?**
a) 48 b) 56 c) 68 d) 82 e) 94

33. 0 , 1 , 8 , 27 , 64 , **?**
a) 87 b) 125 c) 91 d) 128 e) 256

34. 5 , 14 , 27 , 44 , 65 , **?**
a) 90 b) 88 c) 109 d) 130 e) 210

35. 0 , 6 , 24 , 60 ,120 , **?**
a) 156 b) 160 c) 210 d) 180 e) 196

36. VWY : OPR :: DEG : ____
a) MOP b) ZYW c) BCE d) GHI e)ZAB

37. UTS : EDC :: WVU :____
a) WXY b) SIM c) RPO d) XWV e)ABC

38. ADG : IKM :: PSV :____
a) KMP b) DFH c) ILM d) DGJ e)PQS

39. BDAC : FHEG :: NPMO :____
a) QTRS b) RQTS c) TRQS d) SQRT e)RTQS

40. PRLN : XZTV :: JLFH :____
a) RTNP b) NRPT c) NPRT d) NTRP e)NRTP

**2011 (GK) ප්‍රශ්න පත්‍රයේ පැරණි කාලීන ප්‍රශ්න 2022 නව දත්ත අනුව යාවත්කාලීන කර ඇති බව සලකන්න.. එමෙන්ම Www.Neertha.lk හරහා MCQ ප්‍රශ්න පත්‍රයක් ලෙස පිළිතුරු සැපයීමේ අවස්ථාව ලබා දී ඇත.**

## .II පත්‍රය - සාමාන්‍ය දැනීම

❖ **ප්‍රශ්න 40 ට ම පිළිතුරු සපයන්න.**

01. ~~2010 ලෝක කුසලාන පාපන්දු තරඟාවලිගය පැවැත්වුණු ලැබුවේ දකුණු අප්‍රිකාවේ කුමන නගරයක ද?~~

2022 ලෝක කුසලාන පාපන්දු සත්කාරකත්වය දැක්වූ මැදපෙරදිග රට කුමක්ද?

-------------------------------------------------------------------------------------------------------------

02. ~~2010 අගෝස්තු මස 16 වන දින ඉන්දියාව සමග ශ්‍රී ලංකාව පැවැත්වුණු ලැබූ එක්දින ක්‍රිකට් තරඟයේ දී පිතිකරුට ලකුණු සියයක් ගැනීම අහිමි කරමින් ශ්‍රී ලංකාවේ පන්දු යවන්නා වූ සූරාජ් රන්දිව් විසින් නිපන්දුවක් යවන ලද්දේ කුමන ඉන්දීය පිතිකරුට එරෙහිව ද?~~

2022 T20 ලෝක කුසලානයේ තරඟාවලියේ වීරයාට හිමි සම්මානය ලබා ගත්තේ කවුරුන්ද ?

-------------------------------------------------------------------------------------------------------------

03. පාකිස්තානයේ වත්මන් අගමැතිවරයා කවුද ?

-------------------------------------------------------------------------------------------------------------

04. ~~චිලී රටේ පතලක දින හැට නවයක් තිස්සේ සිරවී සිටි පතල් කරුවන් බේරා ගැනීම් ගැනීම සඳහා 2010 ඔක්තෝබර් මසදී භාවිතා කරනු ලැබූ යානාවට දී තිබූ නම කුමක්ද?~~

The Seven Moons of Maali Almeid නවකතාව රචනා කරමින් 2022 වසර සඳහා වන බුකර් සම්මානයට පාත්‍ර වූ ශ්‍රී ලාංකික ලේඛකයා කවුද?

-------------------------------------------------------------------------------------------------------------

05. කොළඹ වැලිකඩ පිහිටි වැලිකඩ බන්ධනාගාරය තවත් නමකින් හඳුන්වනු ලබයි එම නම කුමක්ද?

-------------------------------------------------------------------------------------------------------------

06. ජංගම දුරකථනය සොයා ගත්තේ කවුද?

----------------------------------------------------------------------------------------------------------------------------

07. වහලුන් ලෙස සේවයේ යෙදීම සඳහා අප්‍රිකාවේ සිට බලෙන් ප්‍රවාහනය කරනු ලැබූ කළු ජාතිකයින්ගේ ඉතිහාසය ගැන කියවෙන ‘Roots’ නම් ප්‍රසිද්ධ ග්‍රන්ථයේ කතුවරයා කවුද?

----------------------------------------------------------------------------------------------------------------------------

08. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නීතිය යටතේ අවම විවාහ විය හැකි වයස කීයද?

----------------------------------------------------------------------------------------------------------------------------

09. ~~2009 වසරේ උතුරේ පැවති යුද්ධයේ අවසාන භාගයේ දී සිදු වූවා යැයි කියනු ලබන මානව හිමිකම් කඩවීම් පිළිබඳව තමාට උපදෙස් දීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය මහලේකම් ලේකම්වරයා විසින් පත් කරනු ලැබූ විශේෂඥ මන්ඩලයේ සභාපතිවරයා කවර ජාතිකයෙක්ද?~~

2024 ඔලිම්පික් උළෙල පැවැත්වෙන්නේ කුමන රටකද?

----------------------------------------------------------------------------------------------------------------------------

10. චෙස් ක්‍රීඩාවක **පෝන්** ලෙස හඳුන්වනු ලබන ඉදිරිපෙළ ඉත්තන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව කීයද?

----------------------------------------------------------------------------------------------------------------------------

11. ~~2010 පවත්වනු ලැබූ ජනාධිපතිවරණයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ලබා ගත් ඡන්ද ප්‍රතිශතය කීයද?~~

2022 අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගනු ලැබූ රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුවේ දී ලබාගත් ඡන්ද සංඛ්‍යාව කොපමණද?

----------------------------------------------------------------------------------------------------------------------------

12. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් දීමනා ලබන ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාල ගණන කීයද?

----------------------------------------------------------------------------------------------------------------------------

13. අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් භාවිත කරනු ලබන කෘතිම මුදල් වර්ගය හැඳින්වීම සඳහා යොදා ගනු ලබන ඉංග්‍රීසි අකුරු තුන මොනවාද?

----------------------------------------------------------------------------------------------------------------------------

14. ඇෆ්ගනිස්තානථානයේ 2021 ජනාධිපතිවරයා කවුද ?

-----------------------------------------------------------------------------------------------------------------------

15. අගලකට මිලිමීටර් කීයක් තිබේද?

-----------------------------------------------------------------------------------------------------------------------

16. 2019 මාර්තු 22 වන දින ඒඩින් බොක්ක හරහා හමා ගියේ කුණාටුවට යොදන ලද නම ශ්‍රී ලංකා විසින් යෝජනා කර තිබූ නමක් විය. එම කුණාටුව හැඳින්වූ නම කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------------------

17. ~~2009 ජුනි මාසයේ දී හමුදා කුමන්ත්‍රණයක් මගින් බලයෙන් පහ කරනු ලැබූ හොන්ඩියුරාවේ ජනාධිපතිවරයාගේ නම කුමක්ද?~~

දින 44 පසු ධුරයෙන් ඉවත් වූ එක්සත් රාජධානියේ අග්‍රාමාත්‍යවරිය කවුරුන්ද?

-----------------------------------------------------------------------------------------------------------------------

18. ~~2010 වර්ෂය සඳහා නොබෙල් සාම ත්‍යාගය දිනා ගත්තේ කවුද?~~

2022 වර්ෂය සඳහා නොබෙල් සාම ත්‍යාගය දිනා ගත්තේ කවුද?

-----------------------------------------------------------------------------------------------------------------------

19. ලෝකයෙ උසම ගොඩනැගිල්ල ලෙස ඩුබායි පිහිටා **බර්ජ් කලීෆා** ගොඩනැගිල්ලේ ඇති මහල්සංඛ්‍යාව කීයද?

-----------------------------------------------------------------------------------------------------------------------

20. ඉලෙක්ට්‍රොනික තැපැල හෙවත් ඊමෙයිල් සොයා ගත්තේ කවුද?

-----------------------------------------------------------------------------------------------------------------------

21. හිරු හා පෘථිවිය අතර සාමාන්‍ය දුර කිලෝ කිලෝමීටර් වලින් දක්වන්න.

-----------------------------------------------------------------------------------------------------------------------

22. චන්ද්‍රයින් වැඩිම සංඛ්‍යාවක් ඇති ග්‍රහයා කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------------------

23. **බූකන්වර්ල්ඩ්** නම් නාසි රැඳවුම් කඳවුර තුළ යුදෙව් ජාතික පිරිමි දරුවකු සඟවා තබා ගනිමින් තම ජීවිතය අවදානමකට ලක් කර ගත් සිරකරුවන් පිළිබඳව දැක්වෙන **'වෘකයන් අතර නග්නව' (Naked among Wolves)** ග්‍රන්තයේ කතුවරයා කවුද?

-----------------------------------------------------------------------------------------------------------------------

24. ~~2009 මැයි මාසයේ දී ආසියානු රටක ප්‍රසිද්ධ ජනාධිපතිවරයෙකු ගල්කින් පහළට පැන සියදිවි නසා ගත්තේය. එම රටක් කුමක්ද?~~

ට්විටර් twiter සමාගමේ නව හිමිකරු කවුරුන්ද?

-----------------------------------------------------------------------------------------------------------------------

25. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයය යටතේ අවසන් ආණ්ඩුකාරවරයා කවුද?

-----------------------------------------------------------------------------------------------------------------------

26. මෑත කාලයේ දී ඇමෙරිකානු රජයේ රහස්‍ය තොරතුරු දහස් ගණනක් හෙළි කරමින් ඒවා පළ කල **වීකිලීක්ස්** නම් වෙබ් අඩවියේ ආරම්භකයා කවුද?

-----------------------------------------------------------------------------------------------------------------------

27. නැපෝලියන් බොනපාට් අවසානයේ දී පරාජයට පත් වූයේ කුමන සුප්‍රකට හමුදා භූමියේ දී ද?

-----------------------------------------------------------------------------------------------------------------------

28. රාත්‍රී අන්ද අන්ධභාවය ඇති වීමට වෙනත් කරුණු අතර කිසියම් විටමින් වර්ගයක අඩු වීම හේතු වේ. එම විටමින් වර්ගය කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------------------

29. ආලෝකයේ වේගය තත්පරයට කිලෝමීටර් කීයද?

-----------------------------------------------------------------------------------------------------------------------

30. ශ්‍රී ලංකාවේ ජනාධිපති අපේක්ෂකයකු වශයෙන් ඉදිරි ඉදිරිපත් වීම සඳහා සපුරාලියයුතු අවම වයස කීයද?

-----------------------------------------------------------------------------------------------------------------------

31. ' එක්ව සිටියොත් අපි ජය ගනිමු. බෙදුනහොත් පරාජයවනු ඇත.' යනුවෙන් පවසන ලද්දේ කවුරුන් විසින්ද?

-----------------------------------------------------------------------------------------------------------------------

32. චීනයේ භාවිතා කරනු ලබන මුදල් වර්ගය කුමක්ද?

--------------------------------------------------------------------------------

33. අරාබි ඉලක්කම් ක්‍රමය යටතේ 157 ඉලක්කම රෝම ඉලක්කම් වලින් ලියන්නේ කෙසේද?

--------------------------------------------------------------------------------

34. ස්විස්ටර්ලන්තයේ අගනුවර කුමක්ද?

--------------------------------------------------------------------------------

35. 1991 දි රුසියානු සමූහාණ්ඩුව කොටස්වලට කැඩී යාමෙන් පසු බිහි වූ නිදහස් රාජ්‍ය සංඛ්‍යාව කීයද?

--------------------------------------------------------------------------------

36. **කැතී පැසිපික්** ගුවන් සේවය අයත් වන්නේ කුමන රටකට ද?

--------------------------------------------------------------------------------

37. බ්‍රවුන් සහ ලක්ෂණය (Brown ‘s Syndrome) නම් රෝගය හට ගන්නේ මිනිස් ශරීරයේ කුමන අවයවයක් සම්බන්ධයෙන්ද?

--------------------------------------------------------------------------------

38. පැසිපන්දු ක්‍රීඩාව සඳහා එක් පිලකට ක්‍රීඩකයන් කී දෙනෙක් සිටීද?

--------------------------------------------------------------------------------

39. ~~2010 මාර්තු මාසයේ දී පැවති ඔස්කාර් සිනමා උළෙලේදී සම්මාන තුනක් විනා ගැනීමට සමත් වූ Avater චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයා කවුද?~~

එක්සත් රාජධානියේ නව අග්‍රාමාත්‍ය ධුරයට සහ කොන්සවේටිව් පක්ෂයේ නායකත්වයට අභිනවයෙන් තේරී පත් වූයේ කවුරුන්ද?

--------------------------------------------------------------------------------

40. ~~2010 වසරේ දී තරග පාදී තරග පාවා දීම පිළිබඳ චෝදනාවකට ලක්වූ පාකිස්තාන ක්‍රිකට් නායකයාගේ නාම කුමක්ද?~~

2022 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල පැවැත්වූයේ කොහෙදිද ?

# Paper III - English and Sinhala Language Paper

Answer both section A and B

## Section A : English Language

**Read the following passage and answer ALL the questions given below.**

A constant theme of those questioning the notion of children being rights holders concerns their relationship with their parents. These doubts are often rooted in the assumption that the concept of children's liberationists. Such an assumption is false, children have a whole range of rights and many such as the right to care and protection, have little to do with making decisions. Acknowledging these may be much more important to young children that acknowledging any claimed right to autonomy. Nevertheless, children soon move out of dependence and into a developmental stage where there is a growing view in wealthy nations that teenagers should be provided with far greater opportunities for developing their decisions making capacities and their sense of responsibility, not only for their own sake, but also for the sake of the communities in which they live. Industrialized societies expect children to emerge from minority immediately ready to take their place as newly minted citizens. In truth, childhood is short and it is unrealistic to argue that a child who is protected throughout from a responsibility and from participation in important decisions regarding his or her upbringing will become a confident young person and responsible citizen.
Schools undoubtedly play an important part in producing confident young people, but most writers agree that the parent's role is infinitely more important. Whilst in Victorian times it might have suited society well to promote the idea that children should be seen and not heard and that parents could treat their children with some disdain, today such ideas have lost their appeal, quite simply because society needs more sophisticated children. 'Good' parents should help their children develop ' the ability to conceive, evaluate alternatives, and act on a life plan - to pursue, in other words, a self given systems of ends that has at least rough internal consistency. However mature, they will be unable to make a successful transition to adulthood unless they are given opportunities for practicing their decision making skills and are provided with 'a dry run' at adulthood. Indeed, contemporary society may have contrived a situation whereby its children can only thrive if they are able to take on more responsibility for their own lives at an earlier age than before and in more complex situations.

1. What is the false assumption that is referred to in the paragraph ?

   ……………………………………………………………………………………………………….

   ……………………………………………………………………………………………………….

2. According to the writer's view what is more important to young children that recognizing their right to autonomy?

   ……………………………………………………………………………………………………….

   ……………………………………………………………………………………………………….

3. What is the unrealistic view discussed in this paragraph?

   ……………………………………………………………………………………………………….

   ……………………………………………………………………………………………………….

4. Explain the emerging view about teenagers in some countries.

   ……………………………………………………………………………………………………….

   ……………………………………………………………………………………………………….

5. The paragraph refers to a conservative idea about children. What is this conservative view?

………………………………………...………………………………………………………………..

………………………………………...………………………………………………………………..

6. What is expected from parents in the modern time?

………………………………………...…………………………………………………………...…………

………………………………………...…………………………………………………………...…………

7. The writer speaks about a pre-condition for successful transition to adulthood. Clarify this pre-condition.

………………………………………...…………………………………………………………...…………

………………………………………...…………………………………………………………...…………

8. According to the author, how can the present society improve the lives of children ?

………………………………………...…………………………………………………………...…………

………………………………………...…………………………………………………………...…………

## Section B : Sinhala Language

**පහත සඳහන් ගද්‍ය පාඨය කියවා එහි දැක්වෙන කරුණු පදනම් කරගෙන අසා ඇති සියළු ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයන්න.**

රෝම ලන්දේසි නීතිය යටතේ ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර පෝෂණය කිරීමේ වගකීම අන්‍යොන්‍ය වුව ද නඩත්තු කිරීමේ මූලික වගකීම් ස්වාමි පුරුෂයා මත පැවරිණි. මෙම වගකීම් ඉස්මතු වූයේ පවුල් ඒකකයේ ප්‍රධානියා වශයෙන් ඔහුගේ තත්ත්වයන් තුළිනි. ඔහු බිරිඳ හා දරුවන් නඩත්තු කිරීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුට එරෙහිව නඩත්තු ඉල්ලා සිටීමට ඔවුනට හැකි විය. මෙම නෛතික තත්ත්වය බිරිඳ හා දරුවන් නඩත්තු කිරීමේ වගකීම ස්වාමිපුරුෂයා වෙත පැවරූ ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් තවදුරටත් ශක්තිමත් කරන ලදි.
මෙම ව්‍යවස්ථාපිත වගකීම මූල්‍ය ආදායමක් නොමැති එහෙත් ඉපැයීමේ හැකියාවෙන් යුත් නමුත් සිතාමතා එසේ කිරීමෙන් වැලකී සිටින ස්වාමිපුරුෂයකුට එරෙහිව ක්‍රියාත්මක කළ හැකි විය. අත්හැර දමනු ලැබූ භාර්යාවකට රෝම ලන්දේසි නීතිය යටතේ අවශ්‍ය දෑ මිල දී ගැනීම සඳහා සැමියාගේ නමින් ණයට බඩු මිලදී ගැනීමට හෝ මේ සඳහා මුදල් ණයට ගැනීමට හැකි විය. තමාගේ වැරැද්දක් නිසා පොදු නිවස බිඳී යාමෙන් පසුව පවා අවශ්‍ය දෑ සැපයීමට සැමියා යටත් වූ බව සිවපාකියම් ඒ. නවමනි අම්මාල් නඩුවේ දී අධිකරණය තීරණය කළේය. ආහාර හා ඇඳුම් වැනි දෑ මිල දී ගැනීම වැනි ගෙදරදොර කළමනාකරණය සම්බන්ධ කරුණුවලදී තමා හා තම සැමියා බන්ධනයට ලක් කරමින් ගිවිසුම්වලට එළඹීමට රෝම ලන්දේසි නීතියට අනුව භාර්යාවට හැකි බව ලාල්වන්ඩ් ඒ. සරවනමුත්තු නඩුවේදී අධිකරණය තීරණය කළේය.

රෝම ලන්දේසි නීතිය අනුව සැමියා නඩත්තු කිරීම සඳහා භාර්යාව සතු වගකීම ඉස්මතු වූයේ ඇයට දේපළ ඇත්නම් හා තමා නඩත්තු කර ගැනීමට සැමියාට නොහැකි නම් පමණි. අසනීප තත්ත්වය හෝ වෙනත් කරුණක් නිසා තමාව නඩත්තු කරගත නොහැකි සැමියා නඩත්තු කිරීම ප්‍රමාණවත් වෙනම දේපළක් ඇති භාර්යාවක් සතු වගකීමක් බව පිළිගත් විවාහක ස්ත්‍රීන්ගේ දේපළ ආඥාපනතට මෙම පරිපෝෂණ වගකීම පසුව ඇතුලත් කරන ලදි. අද නඩත්තු පනත මගින් මෙම වගකීම සැමියා හා බිරිඳ අතර සමානව බෙදා ඇති නමුත් මනා සෞඛ්‍ය තත්වයෙන් සිටින හා රැකියාවක් කිරීමෙන් වැලකී සිටින සැමියකු නඩත්තු කිරීම සඳහා රැකියාවක් සොයාගන්නා ලෙස රැකියාවක් නොකරන භාර්යාවකට අධිකරණයක් විසින් බල කරනු ඇතැයි සැක සහිතය.

එකට ජීවත් වෙමින් විවාහ වගකීම ඉටු කිරීම කලත්‍රයන් දෙදෙනාගෙන්ම අපේක්ෂා කරන අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි.
රෝම ලන්දේසි නීතියට අනුව එකට ජීවත් වීම එක් කලත්‍රයකු විසින් ප්‍රතික්ෂ්ප කළ විට තමා සමඟ එකට ජීවත් වෙන ලෙස බල කරමින් වෛවාහක අයිතිවාසිකම් යථා තත්ත්වයට පැමිණවීම සඳහා නඩු පැවරීමට අනෙක් පාර්ශවයට හැකි විය. මුල් කාලයේ පටන් අපේ අධිකරණ මෙම ප්‍රතිකර්මය ලබා දීම ප්‍රතික්ෂේප කළේය. කෙසේ වුව ද වෙන්ව ජීවත්වීමට එකඟතාවක් නීතියට අනුව වලංගු බව අධිකරණ විසින් තීරණය කර ඇත. අද පවා එකට ජීවත් වීමේ වගකීම විවාහ සම්බන්ධතාවේ ප්‍රතිඵලයක් වන අතර එකට ජීවත් වීම සඳහා කාලත්‍රයා ප්‍රතික්ෂ්ප කළහොත් පීඩාවට පත් වූ පාර්ශවයකට තමා සමඟ ජීවත් වීමේ ප්‍රතික්ෂේප කරන පාර්ශවයකට එරෙහිව ද්වේශ සහගත ලෙස අත්හැර යාම සම්බන්ධයෙන් දික්කසාද නඩුවක් පැවරිය හැකිය

1. රෝම ලන්දේසි නීතිය යටතේ ස්වාමි පුරුෂයා සතු මූලික වගකීම කුමක් ද ?

……………………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………………

2. සැමියා විසින් අත්හැර දමනු ලැබූ භාර්යාවකට රෝම ලන්දේසි නීතිය යටතේ ලැබූ සහන මොනවා ද ?

……………………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………………

3. ලාල්වන්ඩ් ඒ.සරවනමුත්තු නඩුවේ තීරණය කුමක් ද ?

……………………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………………

4. රෝම ලන්දෙසි නීතිය අනුව භාර්යාවක් විසින් සැමියා නඩත්තු කළ යුතු වූ අවස්ථාවන් මොනවා ද ?

……………………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………………

5. පරිපෝෂණ වගකීම සම්බන්ධයෙන් විවාහක ස්ත්‍රීන්ගේ දේපළ ආඥාපනත හා අද නඩත්තු පනත අතර වෙනස කුමක් ද ?

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

6. රෝම ලන්දේසි නීතියට අනුව එකට ජීවත් වීම යම් කලත්‍රයෙකු විසින් ප්‍රතික්ෂේප කළහොත් අනෙක් පාර්ශවයට ලබාගත හැකි සහන මොනවා ද ?

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

7. වර්තමාන නීතියට අනුව එකට ජීවත් වීම යම් කාලත්‍රයෙකු විසින් ප්‍රතික්ෂේප කළහොත් අනෙක් පාර්ශ්වයට ලබා ගත හැකි සහන මොනවා ද ?

……………………………………………………………………………………………………………………

8. ඉහත ඡේදයට අනුව තම බිරිඳ හා දරුවන් නඩත්තු කිරීමෙන් වැලකී සිටීම සඳහා ස්වාමි පුරුෂයෙකුට ඉදිරිපත් කළ හැකි හේතු මොනවා ද ?

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………